# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2009**

**2010 ඔක්තෝබර්**

**BMGT E 1025 – ව්‍යාපාර ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

(01) (අ) "ව්‍යාපාරයක් මූල්‍ය තත්වය පිළිබඳව අදහස් ලබා ගැනීමේදී එහි ද්‍රවශීලතාවය සහ නුබුන්වත් බව යන සාධක වඩාත් වැදගත් වේ". ඔබ මෙම ප්‍රකාශයට එකඟ වේද? පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ආ) සමාගමක් සිය ආදායම් ප්‍රකාශයේ මුහුණතෙහි අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළයුතු තොරතුරු මොනවාද?

(ලකුණු 02)

(ඇ) මුදල් ප්‍රවාහයන් වාර්තාකරණ ප්‍රධාන ක්‍රම දෙක දක්වන්න

(ලකුණු 02)

(ඈ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 10 ට අනුව "ගිණුම්කරණ ප්‍රතිපත්ති" යන්න නිර්වචනය කර ආයතනයකට ගිණුම් ප්‍රතිපත්තීන් වෙනස්කළ හැකි අවස්ථාවක් දක්වන්න.

(ලකුණු 02)

(ඉ) අසම්භාව්‍ය බැරකම් යන්න පැහැදිලි කර අසම්භාව්‍ය බැරකම් සඳහා උදාහරණයක් දක්වන්න.

(ලකුණු 03)

(ඊ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 18 ට අනුව පහත පද නිර්වචනය කරන්න

(i) ධාරණ අගය

(ii) ක්ෂය කළහැකි අගය

(ලකුණු 02)

(මුළු ලකුණු 15)

(02) සී/ස සඳුන් සමාගම 2009/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී පහත සිද්ධීන් සැලකිල්ලට ගත යුතුව ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත්තේ 2009 ජූනි 07 වන දින බව සලකන්න.

(i) 2009/03/31 දින පිරිවැය රු. 750, 000/= ක් වූ තොග 2009 මැයි 07 රු. 700, 000/= ක අගයකට උපලබ්ධි කිරීම.

(ii) 2009/03/31 දිනට ආයෝජන වල පිරිවැය රු. 350, 000ක් වූ අතර 2009 මැයි මස 30 වන දිනට කරන ලද ඇගයීමට අනුව වෙළඳපල අගය පිරිවැයට වඩා 20%ක් අඩුවී ඇති බව අනාවරණය විය.

(iii) සඳුන් සමාගමේ ඉදිකිරීමේ ව්‍යාපෘතියක් හේතුවෙන් වන සම්පත් විනාශ වීමක් සිදුවී ඇත. සමාගම විසින් පරිසරයට සිදුවන හානිය අවම කිරීම සඳහා සෑම වසරක් අවසානයේ ශාක රෝපනය සඳහා පියවර ගන්නා බවට ප්‍රතිපත්තියක් 2008 අප්‍රේල් මස ප්‍රසිද්ධ කර ඇත.

(iv) සමාගමේ ඉඩමකින් කොටසක් මහා මාර්ගයක් පුළුල් කිරීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවරාගෙන ඇති අතර ඒ සඳහා රු. ලක්ෂ 20 ක වන්දියක් ගෙවන ලෙස නෛතික හිමිකම් පෑමක් කර ඇත.

(v) සමාගම සතු මෝටර් රථ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| 2008/03/31 දිනට පිරිවැය | රු. 600,000/= |
| 2008/03/31 දිනට සමුච්චිත ක්ෂය | රු. 120,000/= |
| 2008/04/01 දිනට ප්‍රත්‍යගණන අගය | රු. 800,000/= |

වාර්ෂික ක්ෂය අනුපාතය සරල මාර්ග ක්‍රමයට 10%

සුන්බුන් අගයක් නැතැයි උපකල්පනය කර ඇත.

(අ) 2009/03/31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව මෝටර් රථ ක්ෂය ගණනය කර, ප්‍රත්‍යාගණන ගිණුම පිළියෙල කරන්න. 2009/3/31 දිනට ශේෂ පත්‍රයේ දක්වන මොටර් රථ වටිනාකම පෙන්වන්න.

(ආ) ඉහත (i), (ii), (iii), (iv) සිද්ධීන් සඳහා අදාළ කරගත යුතු ගිණුම් ප්‍රමිතය දක්වා 2009/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙළ කරන මූල්‍ය ප්‍රකාශන වලට මෙම සිද්ධීන් අදාළ වන ආකාරය පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 15)

(03) 2009/03/31 දිනට මානෙල් සමාගමේ පොත්වලින් උපුටාගන්නා ලද ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | හර | බැර |
|---|---|---|
| | රුපි. '000 | රුපි. '000 |
| විකුණුම් | | 85,000 |
| ගැණුම් | 35,000 | |
| ආපසු එවුම් | 600 | |
| ආපසු යැවුම් | | 800 |
| දුරකථන | 300 | |
| වරිපනම් | 900 | |
| අඩමාන ණය වෙන්කිරීම 2008/04/01 | | 600 |
| ණය ගැතියෝ | 15,000 | |
| පරිපාලන වියදම් | 5,400 | |
| මෝටර් රථ පිරිවැය (2008/04/01) | 40,000 | |
| ලී බඩු හා කාර්යාල උපකරණ පිරිවැය (2008/04/01) | 25,000 | |
| ඉඩම් පිරිවැය (2008/04/01) | 80,000 | |
| බඩු ගොඩනැගිලි 2008/04/01 | 18,000 | |

| | | |
|---|---|---|
| ක්ෂය වෙන් කිරීම් 2008/04/01 | | |
| මොටර් රථ | | 18,000 |
| ලී බඩු හා කාර්යාල උපකරණ | | 10,000 |
| විකුණුම් වියදම් | 6,300 | |
| ආදායම් බදු ප්‍රතිපාදන 2007/2008 | | 1,500 |
| ගෙවන ලද ආදායම් බදු | | |
| වර්ෂය - 2007/2008 | 1,200 | |
| වර්ෂය - 2008/2009 | 700 | |
| 20% ණයකර | | 12,000 |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 62,000 |
| 12% වරණීය කොටස් ප්‍රාග්ධනය | | 25,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 6,000 |
| පොදු සංචිතය | | 18,000 |
| රඳවාගත් ලාභ | | 15,200 |
| අතුරු ලාභාංශ ගෙවීම් | | |
| වරණීය කොටස් | 900 | |
| සාමාන්‍ය කොටස් | 2,000 | |
| ණය හිමියන් | | 5,620 |
| වැටුප් හා වේතන | 10,500 | |
| ප්‍රචාරණ වියදම් | 1,200 | |
| තොගය 2008/04/01 | 9,300 | |
| බැංකු හර බදු | 20 | |
| බැංකු හා මුදල් ශේෂය | 4,900 | |
| අධ්‍යක්ෂක ගාස්තු | 1,700 | |
| විගණන ගාස්තු | 800 | |
| | 259,720 | 259,720 |

පහත සඳහන් අමතර තොරතුරු සපයා ඇත.

(1) 2009/03/31 දිනට අවසන් තොගය රුපියල් 9,800,000 කි.

(2) උපචිත දුරකථන වියදම් 2009/03/31 දිනට රු. 10,000/ක් වන අතර ඉදිරියට ගෙවූ වරිපනම් රු. 20,000/= කි.

(3) 2008/10/01 වන දින පිරිවැය රු. 500,000/= වටිනා ලීබඩු කාර්යාල ප්‍රයෝජනයට මිලට ගන්නා ලදී. මෙය පරිපාලන වියදම් ගිණුමට හර කර මුදල් ගිණුම බැර කර ඇත.

(4) 2004/04/10 දින මිලට ගත් පිරිවැය රුපියල් 1800,000/= වූ මෝටර් රථයක් 2008.12.10 දින රු. 800,000 කට විකුණූ අතර එම මුදල් සහ කෙටිකාලීන බැංකු ණයක් වශයෙන් ලබාගත් රු. 700,000/= ක මුදල් යොදා නව මෝටර් රථයක් 2009/01/15 වන දින මිලට ගන්නා ලදී. මේ පිළිබඳව පොත්වල සටහන් කර නැත.

(5) දේපල පිරියත හා උපකරණ වාර්ෂිකව පිරිවැයට සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුවේ.

මෝටර් රථ 15%

ලී බඩු හා උපකරණ 20%

ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තියක් ලෙස ස්ථාවර වත්කම් මිලට ගන්නා වර්ෂයට අදාළව සම්පූර්ණ ක්ෂය ගණනය කරන අතර විකුණන වර්ෂයට අදාළව ක්ෂය ගණනය නොකරයි.

(6) වර්ෂය තුළදී සමාගමේ ඉඩම් රු. 91,000,000/= ක් සේ ප්‍රත්‍යාගණනය කර ඇත.

(7) කාර්යාලය පවත්වාගෙන යාමට අත්පත්කරගත් බදු ගොඩනැගිලි ගිණුම නිරූපනය කරන්නේ 2006/04/01 දින සිට වසර දහයක් (10) සඳහා බදු ගිවිසුමක් යටතේ අත්පත්කරගත්

ගොඩනැඟිල්ලක් සඳහා සම්පූර්ණ බදු කාලය වෙනුවෙන් ගෙවන ලද මුදලේ 2008/04/01 දිනට ශේෂයයි.

(8) රු. 100,000 ක ණය ගැතියෙක්ගේ ශේෂයක් බොල්ණය වශයෙන් කපා හැරිය යුතු අතර ඉතිරි ණය ගැතියන්ගෙන් 5% අඩමාන ණය සඳහා වෙන්කිරීමක් කළ යුතුය.

(9) ආදායම් බදු 2008/2009 වර්ෂය සඳහා රු. 1,600,000/= සේ ඇස්තමේන්තු කර ඇත. 2007/2008 වර්ෂය සඳහා වූ ආදායම් බදු වගකීම සම්පූර්ණයෙන් ගෙවා ඇත.

(10) 2009.03.31 දින අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී පහත යෝජනා සම්මත කරගෙන ඇත.

- වරණීය කොටස් සඳහා ඉතිරි ලාභාංශ ගෙවීම
- පොදු සංචිතයට රු. 500,000/= ක් මාරු කිරීමට

(11) ලාභාංශ බදු නොසලකා හරින්න.

2009 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා ඔබ විසින් ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකෘතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කළ යුතු අතර, ඊට අදාළ ගිණුම් සටහන් දක්වන්න.

(ලකුණු 30)

(04) සීමිත චතුරි සමාගම 2009 මාර්තු මස 01 වන දින රු. 40/= බැගින් සාමාන්‍ය කොටස් 50,000 ක් නිකුත් කරන ලදි. ගෙවියයුතු ආකාරය පහත පරිදි වේ.

| | |
|---|---|
| අයදුම්පත් සමග | රු. 12/= |
| විභජන මුදල් | රු. 14/= |
| ඇරයුම් මුදල් | රු. 14/= |

සමාගමට කොටස් 90,000 ක් සඳහා අයදුම්පත් ලැබුනි. කොටස් 20,000 ක් සඳහා වූ අයදුම්පත් ප්‍රතික්ෂේප කර මුදල් ආපසු යවන ලදි. කොටසක් 20,000 ක් ඉල්ලුම් කර තිබූ සේවකයින්ට මුළුමනින්ම හා ඉතිරි අයදුම්කරුවන්ට සමානුපාතික පදනමට විභාජනය කරන ලදි. විභජනය හා ඇරයුම් මුදල් කැඳවන ලදි.

විභාජනයේදි හා ඇරයුමේදී හිඟයක් තිබූ කොටස් පිළිබඳව තොරතුරු පහත පරිදි වේ.

කොටස් 6000 ක් අයදුම් කළ සේවකයෙක් නොවන අයදුම්කරුවකු විභාජනයේදි හා ඇරයුමේදී ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීම.
අධ්‍යක්ෂක මණ්ඩලය විසින් හිඟයක් සහිත කොටස් සියල්ලම අහිමි කිරීමට තිරණය කරන ලදි. මෙම කොටස් රු. 30 බැගින් නැවැත නිකුත් කර මුදල් ලබා ගන්නා ලදි.

ඉහත ගණුදෙනු සටහන් කිරීමට අවශ්‍ය ජ'නල සටහන් දක්වන්න.

(ලකුණු 15)

(05) (අ) හවුල් ව්‍යාපාරය සම්බන්ධයෙන් බලපවත්වන නීතිමය තත්වයන් මොනවාද?

(ලකුණු 03)

(ආ) ආශා සහ නිරාශා පිලිවෙලින් 4:1 යන අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය අතර 2009/03/31 දිනට ශේෂ පත්‍රය පහත දක්වේ.

ආශා නිරාශා හවුල් ව්‍යාපාරයේ 2009.03.31 දිනට ශේෂ පත්‍රය

| ප්‍රාග්ධනය | (රුපියල්) | ස්ථාවර වත්කම් | පිරිවැය රුපි. | ක්ෂය රුපි. | ශුද්ධ අගය රුපි. |
|---|---|---|---|---|---|
| ආශා | 240,000 | ඉඩම් | 117,000 | - | 117,000 |
| නිරාශා | 60,000 | යන්ත්‍ර | 20,000 | 4,000 | 16,000 |
| | | මෝටර් රථ | 55,000 | 8,000 | 47,000 |
| ජංගම වගකීම් | | | | | |
| ණය හිමියෝ | 72,000 | ජංගම වත්කම් | | | |
| බැංකු අයිරාව | 18,000 | තොගය | | | 70,500 |
| | | ණය ගැතියෝ<br>(-) අඩමාන ණය වෙන්කිරීම | | 144,000<br>(7,500) | 136,500 |
| | | මුදල් | | | 3,000 |
| | **390,000** | | | | **390,000** |

2009.03.31 දින ලාභයෙන් 1/6 ක් සඳහා හවුල් කරුවකු වශයෙන් මාෂා ඇතුලත් කරගන්නා ලදි. පහත සඳහන් ගැලපීම් ඇති කිරීමට තීරණය කරන ලදි.

(1) රු. 4000 ක බොල් ණය කපා හැර ඉතිරි ණය ගැතියන්ගෙන් අඩමාණ ණය සඳහා 5% ක් සේ ගැලපීම

(2) රු. 27,000 ක් පිරිවැය වූ වාහනයක් ආශා විසින් එහි ශුද්ධ අගය වූ රු. 24,000 ට පවරා ගන්නා ලදි. ඉතිරි මෝටර් රථ රු. 30,000 ට ප්‍රත්‍යාගණනය කිරීම

(3) ඉඩම් රු. 150,000 කටද තොගය රු. 62,500 කටද යන්ත්‍ර රු. 14,500 කටද ප්‍රත්‍යාගනනය කිරීම.

(4) කීර්තිනාමය රු. 24,000 ට තීරණය කළ අතර කීර්තිනාම ගිණුමක් විවෘත නොකිරීමට තීරණය විය.

(5) මාෂා විසින් ගෙන එන ලද මුදල්වල අඩංගු කීර්තිනාමයේ කොටස පැරණි හවුල් කරුවන් විසින් මුදලින් ආපසු ලබා ගැනීමට තීරණය විය.

(6) ව්‍යාපාරයේ මුළු ප්‍රාග්ධනය වශයෙන් රු. 360,000 ක් තබා ගැනීමට තීරණය විය. ප්‍රාග්ධනයට හවුල්කරුවන් දායකවිය යුත්තේ ලාභ බෙදාගන්නා අනුපාතයට අනුව බව තීරණය විය. වැඩිපුර මුදල් රැගෙන යෑමටත් හිඟය ව්‍යාපාරයට ගෙන ඒමටත් තීරණය විය.

පහත දෑ පිළියෙල කරන්න.

(අ) නව ලාභාලාභ අනුපාතය දක්වන්න.

(ආ) මාෂා විසින් ව්‍යාපාරයට ගෙන ආ යුතු මුදල දක්වන්න.

(ඇ) ප්‍රත්‍යාගණන ගිණුම

(ඈ) හවල් කරුවන්ගේ ප්‍රධාන ගිණුම තීරු ක්‍රමයට

(ඉ) ආශා, නිරාශා සහ මාෂාගේ අළුත් හවුල් ව්‍යාපාරයේ 2009.04.01 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

(ලකුණු 22)

(මුළු ලකුණු 25)